කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - **2019**
---------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු.58,090,138 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ අතර වෙනත් ආදායම් යටතේ දක්වා තිබූ රු.273,201 ක් වූ යන්ත්‍ර සූත්‍ර ක්ෂය අධි වෙන්කිරීම බදු පෙර ලාභයට ගළපා නොතිබුණි.<br>තවද කාර්යාල උපකරණ අපහරණයෙන් ලද රු.272,461 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පෙන්වා දී ඇති ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙල නිවැරදි කිරීමට හා නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නැවත ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රමිතය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය. |
| (ආ)අධිකාරිය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින පිරිවැය රු.36,839,950 ක් වූ වාහනවල ඵලදායි ජීව කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව නැවත සමාලෝචනය කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරද නොතිබුණි. | 2020 වර්ෂය තුළදී වාහන නැවත තක්සේරු කිරීමට සටහන් කරගතිමි. | ප්‍රමිතය අනුව වත්කම්වල ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ සියලුම ලීබඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණද ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලවල එම වත්කම් | ගාල්ල තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත.කෙසේ වෙතත් ඔබගේ යෝජනාව පරිදි 2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමට සටහන් කරගතිමි.<br>එසේම ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව අධිකාරියේ ඉඩම් ප්‍රත්‍යාගණනය කර 2020 වර්ෂයේ අවසන් ගිණුම්වල ගැලපීමට සටහන් කර ගතිමි. | ප්‍රමිතය අනුව දේපළ, පිරියත හා උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය.එසේම සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් |

| | | |
|---|---|---|
| පන්තිය සම්පූර්ණයෙන්ම ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එසේම ප්‍රමිතයේ 47 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් රු.38,815,350 ක වටිනාකමකට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉඩම් අධිකාරිය විසින් 2005 දෙසැම්බර් 31 දිනෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එමනිසා මෙම ඉඩම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය නොවන බව නිරීක්ෂණය විය. | | ඉඩම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ රු.4,807,865 ක් වූ පොලී ආදායම මත ගෙවියයුතු රු.1,346,202 ක ආදායම් බදු වගකීම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොලී ආදායමට සෘජුවම අදාළ වන රඳවා ගැනීමේ බදු අඩුකළ පසු අගය ,ආදායම තුළ ගිණුම්ගත කර ඇත. බදු ගෙවීමක් හෝ බදු පැහැර හැරීමක් පිළිබඳ ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් දැනුවත් කිරීමක් නොමැති බව දන්වමි. | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු මුදල් ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කළ යුතුය. |
| (ආ) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා 1998 වර්ෂයේදී ණය පදනම යටතේ ලබා දී තිබූ වාහන ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,664,321 ක් එම සමිතිවලින් ලැබිය යුතු ප්‍රතිව්‍යුහගත වාහන ණය ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි හා ඉකුත් වර්ෂයේදි එම ණය ශේෂයට අයත් වාහන වලින් වාහන 23 ක් අධිකාරියට පවරාගෙන විකිණීමෙන් ලද රු.9,823,577 ක මුදලින් රු.9,207,958 ක් ගෙවිය යුතු තැන්පත් ලෙස ගිණුම් ගත කර තිබුණද ඉහත ප්‍රතිව්‍යුහගත ණය ශේෂයට අදාළ නිරවුල් කළයුතු මුදල හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරිපත් කර ඇති පරිදි ප්‍රතිව්‍යුවහගත රු.6,664,321 ක මුදල තුළ ඇතුළත් සමිති වාහන ලබාදීමේදී ඇති වූ පාඩුව රු.6,315,532 කි. එම මුදල ගිණුම් පොත් තුළින් කපාහැරීමට මේ වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා කමිටු නිර්දේශ ලබා දී ඇති අතර ලියාහැරීමට භාණ්ඩාගාරයෙන් අනුමැතියද ඉල්ලා ඇත. වාහන විකුණුම් තුළින් ලද මුදල් ලියාහැරීමට භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලූ නමුත් මෙතෙක් නොලැබීම හේතුවෙන් ලියාහැරීමට අනුමැතිය ලැබෙන තෙක් ගිණුම් තුළ මෙලෙස දක්වා ඇත . | අධිකාරියට පවරාගත් වාහන ගිණුම් ගත කළ පසු විකිණීමෙන් ලද මුදලින් වියදම් නිරවුල් කර ඉතිරිය භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ගාල්ල ප්‍රාදේශිය කාර්යාලයට අයත් වලහන්දූව පැළ තවාන සඳහා ගෙවා තිබුණු ඉදිරියට කළ ගෙවීම් රු.1,056,844 ක් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට එම වියදම පැළ තවානෙහි සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති අවසන් තොග වටිනාකමට එකතුකර තිබුණි.මෙම නිසා එහි අවසන් තොගයේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ වලහන්දූව තවාන්හි 2019 දෙසැම්බර් 31 දිනට 2018/2019 තවාන් පැළ හා 2019/2020 තවාන් පැළ ලෙස කාලපරිච්ඡේද 2කට අයත් පැළ භෞතිකව පැවතිණි . සමාලෝචිත වර්ෂයේ ලාභ අලාභ ගණනය කිරීමේදී 2018/2019 තවානේ සියලුම ආදායම් හා වියදම් නිසි ලෙස ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂයේ වලහන්දූව තවානේ ලාභය ගණනය කර ඇති බව දන්වමි. | ඉදිරි වර්ෂය සඳහා කළ ගෙවීම් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය නවීකරණය කිරීම සඳහා **2019** දෙසැම්බර් **31** දින රු.**8,096,120** ක් වූ කොන්ත්‍රාත්තුව ගාල්ල පිටිගල ප්‍රදේශයේ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදි මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර නොතිබුණි.එසේ වුවත් මෙම කොන්ත්‍රාත්තුවට අදාළව වූ රු.**10,000,000** ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ ලෙස වෙනත් මූල්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර එම වටිනාකමින් ණයහිමි ගිණුම බැරකර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කෙරීගෙන යන වැඩ සහ ණයහිමියයෝ එම ප්‍රමාණවලින් වැඩියෙන් දැක්වුණි. | වෙන් වූ ප්‍රතිපාදන යටතේ ගොඩනැගිල්ලේ සිදු කළ යුතුව තිබූ අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් 2019 වර්ෂයේ ආරම්භ කරන ලදී. කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමූ මුදලට අමතරව පැරණි ගොඩනැගිල්ලක අලුත්වැඩියාවක් වීමත් ගාලූ උරුමයේ නිර්දේශය මත කළ යුතු වීමත් මත ඇති වන අවිනිශ්චිත වියදම් මෙන්ම බදු මුදල් ද ඇතුලු රු.මිලියන 10 ක් සඳහා කෙරීගෙන යන වැඩ හා ණය හිමියන් යටතේ ගිණුම්ගත කර ඇත. | සමාලෝචිත වර්ෂය අවසානයට ඉංජිනේරු විසින් සහතික කරන ලද වැඩ වටිනාකම පමණක් කෙරීගෙන යන වැඩ සහ ණයහිමියයෝ ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ)සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික තොග සත්‍යාපනය අනුව පිරිවැය රු. **6,454,098** ක් වූ ප්‍රධාන කාර්යාලයට අයත් තොග ශේෂයන් භෞතිකව නොපවතින බව අනාවරණය කරගෙන තිබුණද ඒ සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | භෞතිකව නොපවතින ශේෂය පැවතීම ආරම්භ වී ඇත්තේ 2004 හා 2005 වර්ෂයන් සිටය. මෙම තොග සැසඳීමක් සිදුකිරීමට විශේෂ වැඩසටහනක් ලෙස සහකාර කළමනාකරු (මුදල්) වෙත පවරා ඇත .මෙම සැසඳීමට අනුව නිවැරදි කිරීමට කටයුතු කරමි. | තොග සැසඳීම් කඩිනමින් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් දැක්විය යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළදී ඇණවුම් කර තිබුණු රු. **5,723,641**ක භාණ්ඩ තොගයක් එම භාණ්ඩ ලැබීමට පෙර විවිධ තොග ගිණුමට හර කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට විවිධ තොග ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ප්‍රසම්පාදන ක්‍රමවේද තුළින් හඳුනාගත් සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීම සඳහා ගැනුම් ඇණවුම් ලබා දී ඇත . ඇණවුම් ලබා දීම තුළින් ඇති කර ගත් බැඳීම් වෙනුවෙන් හා ගිවිසුම්ගත වීම ණයහිමි ප්‍රමාණය ණයහිමියන් බැර කර තොග ගිණුමට රු.5,723,641ක් හර කර ඇත . | සමාලෝචිත වර්ෂය තුළදී ඇණවුම් කරන ලද නමුත් ගබඩාවට ලැබී නොමැති භාණ්ඩ මාර්ගස්ථ තොග ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ)සමාලෝචිත වර්ෂය අවසානයට රු.**14,260,603** වූ පැළ තවාන් තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද එය වෙනත් මූල්‍ය වත්කමක් ලෙස දක්වා තිබුණි. | පසුගිය වර්ෂයන්හීදී පැළ තවාන් තොගය අඩු ද්‍රවශීලීතාවයකින් යුක්ත වීම මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් මූල්‍ය වත්කම් ලෙස දක්වා තිබුණි .එනමුත් යෝජනා කර ඇති පරිදි 2020 වර්ෂයේදී ජංගම වත්කම් යටතේ දැක්වීමට සටහන් කර ගතිමි. | පැළ තවාන් තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතුය |
| (ඌ)සමාලෝචිත වර්ෂයේ රු.**73,907,078** ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ ඉඩම් වටිනාකම තුළ, අධිකාරියට අයිතිය පවරා නොගත් රජය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව , මහවැලි අධිකාරිය වැනි ආයතනවලට හිමි රු.**35,091,728** ක් වූ ඉඩම්ද ඇතුළත් කර තිබුණු නමුත් මෙම ඉඩම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | දේපළ නියමානුකූල ලෙස පවරා ගැනීමට ඉදිරි කටයුතු කරමින් පවතින බැවින් හා අදාළ පවරාදීම් කටයුතු දැනටමත් සිදු කරමින් පවතින බැවින් අදාළ දේපළ වටිනාකම් අධිකාරියේ වාර්ෂික ගිණුම් වලට ඇතුළත් කර ගිණුම් ගත කර ඇත ඉහත සියලු කරුණු සලකා අදාළ දේපළ 2005 වර්ෂයේදී ප්‍රත්‍යාගණන වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කර ඇති අතර අධිකාරිය සතු දේපළ තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. නිරවුල් කර නොමැති දේපළ | ඉඩම් අයිතිය කඩිනමින් අධිකාරියට පවරාගැනීමට හා අධිකාරියට අයිතිය පවතින වත්කම් පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

ඉදිරියේදී ගිණුම්ගත කිරීමේදි ,සටහන් යොදා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම්

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | | | | | |
| ගාල්ල | 19,230,055 | 18,751,782 | 478,273 | ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රාදේශීය කාර්යාල ගිණුම් අනුව නිරූපනය කර නැත. | |
| රත්නපුර | 20,137,376 | 20,230,036 | 92,660 | ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රාදේශීය කාර්යාල ගිණුම් අනුව නිරූපනය කර නැත. | |
| ලී බඩු හා සවිකිරීම් - හන්තාන | 3,283,901 | 3,241,026 | 42,875 | 2018 වර්ෂයේ ලී බඩු සවිකිරීම් අපහරණ ලෙස රු. 42,875 ක මුදලක් ගිණුම්ගත කර තිබූ අතර 2019 වර්ෂයේදි ද එම ප්‍රමාණය අත්වැරදීමකින් ප්‍රත්‍යාගණනයන්හි නිරූපනය කර ඇත. එම ප්‍රමාණය ක්ෂය වීම් වලින් පමණක් අඩු කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල හා ප්‍රාදේශීය කාර්යාලවල ගිණුම් වාර්තාවන්හි පවත්නා වෙනස්කම් සැසඳීම් කර වැරදි නිවැරදි කළ යුතුයි. |
| අන්තර් ජංගම ගිණුම- හන්තාන | 86,800,290 | 86,690,565 | 109,725 | කෑගල්ල හා හන්තාන ප්‍රාදේශීය කාර්යාල අතර මෙතම් සෝඩියම් හුවමාරු වටිනාකම හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ ජංගම ගිණුම්හි සටහන් නොවීම. | |
| උපචිත සහනාධාර ආරම්භක ශේෂය- ගාල්ල | 39,921,584 | 39,184,834 | 736,750 | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ 2019 වර්ෂයේ උපචිත වගා සහනාධාර ආරම්භක ශේෂය සටහන් කිරීමේ දී සිදු වු දෝෂය. | |
| එකතුව | | | <u>1,460,283</u> | | |

### 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1998 වර්ෂයේදි පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි ලබාගැනීම සඳහා කුඩා තේ වතු සමිති වලට ලබා දී තිබූ ණය | 1998 වර්ෂයේ සිට මෙම අයවිය යුතු මුදල් අය කර ගැනීම සඳහා විවිධ උත්සහයන් කර තිබුණි. සමස්ත ලංකා සමිති සංවිධානය වෙත අයකර දීමේ වගකීම | ලැබිය යුතු මුදල් අයකරගැනීමට හෝ විධිමත් අනුමැතියකින් |

| | | | |
|---|---|---|---|
| | මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.4,300,942 ක ණය ශේෂය වසර විස්සකට වැඩි කාලයක සිට පියවා ගැනීමට හෝ පොත්වලින් ලියා හැරීමට පියවර ගෙන නොතිබුණි. | පැවරීම මගින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පොත්වලින් ලියාහැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩ සටහන මඟින් ලබාදී තිබූ ණය මුදලින් පෞද්ගලික කම්හල් 4 කින් ලැබිය යුතු රු.5,916,589 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වර්ණ විභේදන යන්ත්‍ර 04න් ඊරියගහ කම්හල වෙත ලබා දුන් යන්ත්‍රයට අදාළ අයවියුතු මුදල් අයකර ගැනීමට නෛතිකව කටයුතු කෙරෙමින් පවතින අතර ගාල්ල විවිධ සේවා සමුපකාර සමිතියට අදාළ යන්ත්‍රය ඇවර කිරීමෙන් අනතුරුව වගකීම් නිදහස් කිරීමේදී අපගේ මුදල් ලබා දීමට එකඟ වී ඇත .ඉතිරි වර්ණ විභේදන යන්ත්‍ර සඳහා අයවීම් අයකර ගැනීමට තවදුරටත් කටයුතු කෙරෙමින් පවතී. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ.681 | විධි විධාන ප්‍රකාරව ගුවන් විදුලිය සහ රූපවාහිනිය මගින් ප්‍රචාරණය කිරීම අත්‍යවශ්‍යයයි සැලකෙන අවස්ථාවලදී අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රචාරණ කටයුතු කළ යුතු වුවද එලෙස පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදි රූපවාහිනිය මගින් ප්‍රචාරණ කටයුතු සඳහා රු.2,194,091 ක් වැයකර කර තිබුණි. | මින් ඉහතදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් රූපවාහිනී මාධ්‍ය භාවිතා කරමින් තාක්ෂණික පණිවිඩ ප්‍රචාරය කර ඇති අතර , ඒ කිසිදු අවස්ථාවක අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියක් ලබාගත් බව තහවුරු නොවේ. මෙම රූපවාහිනී ප්‍රචාරණයන් සඳහා ආයතනයේ සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වා සිටිමි. | ප්‍රචාරණ කටයුතු සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii)මු.රෙ.682 | දේශපාලනයෙහි නිරත පුද්ගලයන් සහ දේශපාලන පක්ෂ හුවා දැක්වෙන ප්‍රවෘත්ති පත්‍ර අතිරේක හා දැන්වීම් පළකිරීම තහනම් වුවත් රු. 3,583,162 ක් වැයකර දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ හුවා දැක්වෙන දැන්වීම් පලකර තිබුණි. | ජාතික පුවත්පත් වල අධිකාරියේ සභාපතිතුමාගේ අනුමැතිය යටතේ පුවත්පත් දැන්වීම් කිහිපයක් පල කරන ලද අතර එම කිසිදු දැන්වීමක් මගින් කිසිවිටෙක දේශපාලනයෙහි නිරත පුද්ගලයින් හා දේශපාලන පක්ෂ හුවා දැක්වීමක් අරමුණු කර නිර්මාණය නොකරන ලද ඒවා බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි වල විධිවිධානවලට යටත්ව ප්‍රචාරණ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) අංක **2018/01** හා **2018** මාර්තු **19** දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය | අධිකාරිය විසින් තේ ශක්ති අරමුදලෙන් අත්පත් කරගෙන තිබූ සමිති වාහන අපහරණයෙන් **2018** හා **2019** වර්ෂයන්හි ලද රු. **9,872,227** ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකර අධිකාරියේ රඳවාගෙන තිබුණි. | අපහරණය කරන ලද සමිති වාහන තුළින් ලද රු.9,872,227 ක මුදල පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට දන්වා ඇත . එසේම මෙම මුදලින් සමිති වෙතින් තව දුරටත් අයවිය යුතු ප්‍රමාණයන් හිලව් කිරීමට අනුමැතිය ඉල්ලා ඇති බැවින් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස දන්වන තෙක් අධිකාරියේ වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත. | භාණ්ඩාගාර ප්‍රදානයන්ගෙන් මිලදීගත් වාහන විකිණීමෙන් ලද මුදල් සම්බන්ධව චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) **1987**අංක **03** දරන පොදු කොන්ත්‍රාත් පනතේ **8**හා **12** වගන්ති | පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා යටතේ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමඟ ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු නොකළයුතු නමුත් ගිවිසුම්ගත වටිනාකම රු.**11,213,888** ක් වූ වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානයේ මාර්ගය දෙපස පැති බැම්ම ඉදිකිරීම හා රු.**7,682,375**ක් වූ ප්‍රධාන කාර්යාලයේ ඇළුමිනියම් දොර ජනෙල් යෙදීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේද ලියාපදිංචි විය යුතු බවට කොන්ත්‍රාත්කරු වෙත අමතර කොන්දේසියක් ඇතුළත් කර නොමැති අතර ඉක්ටැඩ් (CIDA) ආයතනයේ නිර්නායක අනුව කටයුතු කිරීම තුළින් අදාළ කොන්ත්‍රාත් කාර්යය හසුරුවා ගැනීමට හැකියාවක් පැවතීමත් අමතර කොන්දේසි පැනවීම තුළින් අදාළ සුලු කොන්ත්‍රාකරුවන් අධෛර්යමත් වීම සැලකිල්ලට ගෙන ඉහත පරිදි කටයුතු කර ඇත.<br>ඒ අනුව ඉදිරියේදී උක්ත පනතේ විධිවිධාන ද සැලකිල්ලට ගෙන යෝජිත පරිදි කටයුතු කිරීමට සටහන් කරගනු ඇත. | පනතේ ප්‍රතිපාදනය අනුව පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා යටතේ ලියාපදිංචි සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමඟ කටයුතු නොකළ යුතුය. |
| (ඈ) අංක පීඊඩී/**12** හා **2003** ජුනි **02** දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා **1971** අංක **38** දරන මුදල් පනතේ **11** වගන්තිය | **2019** දෙසැම්බර් **31** දිනට අධිකාරිය විසින් රු.**100,185,473** ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්ගේ අනුමැතිය මත රු.මිලියන 15.3 ක මුදල් ස්ථිර තැන්පතු තුළ ආයෝජනය කර ඇත. මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ සේවක ණය චක්‍රීය අරමුදලට අයත් රු.මිලියන **84.8** ක් සත්දින තැන්පතු තුළ ආයෝජනය කර ඇත. | අදාළ අමාත්‍ය වරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගතයුතුය. |

## **1.8** මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පවතින රු.**20,390,000** ක සත්දින තැන්පත් දින **189** සිට දින **2,584** ක කාල පරාසයක පැවති බව විගණනයේදි නිරීක්ෂණය විය. **2019** දෙසැම්බර් **31** දිනට සත්දින තැන්පතු සඳහා පොලී අනුපාතය සියයට **5.5** පමණක් වීම හේතුවෙන් ස්ථාවර තැන්පත්වල ආයෝජනය නොකිරීම හේතුවෙන් වැඩි පොලී ආදායමක් ලැබීමට අධිකාරියට තිබූ අවස්ථාව අහිමිවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ. | සත්දින තැන්පතු තුළ ආයෝජනය කර ඇත්තේ කෙටි කාලයක් තුළ මුදල් අවශ්‍යතාවයක් නොවන අතිරික්ත මුදල්ය . නමුත් ඉදිරිපත් වන ණය ඉල්ලීම් සඳහා ගෙවීම් කිරීමට හැකි වන පරිදි සත් දින තැන්පතු තුළ ආයෝජනය කර ඇත . ස්ථිර තැන්පතු කල්පිරෙන දින තෙක් සිටිය යුතු වීම මත සත්දින තැන්පතු තුළ ආයෝජනය කළ බව දන්වමි. | අධිකාරියට වඩාත් ලාභදායී වන ලෙස ආයෝජන තීරණ ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**78,799,494** ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.**62,748,445** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**16,051,049** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් සඳහා ලද රජයේ ප්‍රදාන ඉක්මවා රු. **42,827,484** ක් ඒ සඳහා වැය කර තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක **1701/1** හා **2011** අප්‍රේල් **11** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) මඟින් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අනුව පාළු පැළ සැපයීමේ වැඩසටහන යටතේ එක් තේ පැළයක් සඳහා ලබාදෙන සහනාධාර මුදල එක් පැළයකට රු.**25** ක් විය යුතු බවට නියම කර තිබුණි.එසේ වුවද මෙකී ගෙවිය යුතු මුදල විධිමත් පරිදි සංශෝධනය කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව එක් පැළයකට රු.**100** බැගින් රු.**138,992,167** ක් සහනාධාර ලෙස ගෙවීම් කර තිබුණි. | රේඛීය අමාත්‍යාංශය මගින් අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව වාර්ෂික ප්‍රතිපාදන වෙන්ව තිබුණි.<br>ඒ අනුව අදාළ සහනාධාර මුදල වැඩි කිරීමට අදාළ චක්‍රලේඛය නිකුත් කිරීමට ප්‍රථම යෝජිත පරිදි සහනාධාර මුදල වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව සහනාධාර වැඩි කිරීමේ චක්‍රලේඛය නිකුත් කර ඒ අනුව සහනාධාර ගෙවීමට කටයුතු කරන ලදි . | වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග විධිමත් පරිදි සංශෝධනය නොකර එහි සඳහන් සීමා උල්ලංඝනය නොකළ යුතුය. |
| (ආ)අධිකාරිය විසින් තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරීන් **70** දෙනෙකු වෙත ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා යතුරුපැදි ලබාදී හිමිකම් කාලය වූ වසර **8** ඉකුත් වීමට පෙර අධිකාරිය විසින් **2014/15** අයවැය යෝජනා යටතේ එම නිලධාරීන් **70** දෙනා වෙත නව යතුරුපැදි ලබා ගැනීම සඳහා සහතිකකර තිබීම නිසා රජයට සිදුවී ඇති අලාභය රු.**10,112,300** ක් විය. | යතුරුපැදි ලබාදීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදු වූ අතර අයදුම්පත සහතික කිරීම පමණක් අධිකාරියේ සාමාන්‍යාධිකාරි විසින් සිදු කරනලද අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් ලිපි මගින් විනය ගැටලු තිබූ නිලධාරින් හැර අනෙකුත් සියලුම ක්ෂේත්‍ර නිලධාරින් වෙත යතුරුපැදිය ලබාගැනීමට අවසරය ලැබී තිබුණි. | පෙර ලබා ගන්නා ලද යතුරුපැදිවල හිමිකම් කාලය ඉක්මවා යාමට පෙර නව යතුරුපැදි නිර්දේශ කිරීම නොකළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තේ නැවත වගා සහනාධාර අදියර **05** කින් ගෙවීමට සැලසුම් කර තිබුණි.2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මෙකී අදියර **05** න් පළමු අදියර තුන සඳහා රු.**918,115,761** ක මුදලක් ලබාගෙන තිබුණු ගොවීන් ඉතිරි සහනාධාර මුදල් ලබාගැනීමට හා තේ නැවත වගා කිරීමට කටයුතු කර නොතිබුණි.මේ අනුව පසුගිය වර්ෂ **5** ක කාලය තුළ දෙන ලබාදී තිබුණු තේ නැවත වගා කිරීමේ | **2012-2017** කාලසීමාව තුළ බිම් සැකසීම සිදුකළ අවසරපත්‍ර වලින් වගාව සම්පූර්ණ කළ ගොවීන් සංඛ්‍යාව 79% හා බිම් ප්‍රමාණය 74% ක් වේ. එසේ හෙයින් සහනාධාර ගෙවීමට වැයවූ මුදලින් 50% ක් අපේක්ෂිත අරමුණට යොමුවී නොමැත යන්නට එකග විය නොහැක.<br>වගාව සම්පූර්ණ නොකරන අවසරපත්‍ර ලාභීන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් ලබාදී ඇති | සහනාධාර මුදල් ලබාගෙන තේ නැවත වගා කටයුතු නොකරන ලද ගොවීන් වගාවට යොමුකරවීම හෝ නැවත අයකරගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ |

| | | |
| --- | --- | --- |
| සහනාධාර මුදලින් සියයට 50 ක් පමණ අපේක්ෂිත අරමුණුට යොදවා නොමැති බව නිරීක්ෂණය විය. එසේ වුවත් මෙකී සහනාධාරලාභීන් නැවත තේ වගාවට යොමුකරවා ගැනීමට හෝ එම මුදල් නැවත අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | උපදෙස් අනුව ප්‍රාදේශීය කාර්යාල මඟින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන නමුත් එම ක්‍රියාවලිය සඳහා අධිකාරියට නෛතික බලයක් නොමැති බැවින් නෛතික බලය ලබා ගැනීමට යොමුවුවත් එම නෛතික ප්‍රතිපාදන ඉවත්කර නියෝග සංශෝධන සිදුකිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් 2014 සැප්තැම්බර් 09 දිනැතිව දැනුම් දී ඇත . | යුතුය. |
| (ආ) කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම , පාලනය කිරීම හා සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබාදීම අධිකාරියේ කාර්යභාරය වන අතර සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු. 7,522,098 ක් වැය කර තිබුණි. එසේ වුවත් අධිකාරියේ අධීක්ෂණය යටතේ කුඩා තේ වතු සංවර්ධන සමිති 1,475ක් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානයට සතුටුදායක මට්ටමේ පැවති සමිති සංඛ්‍යාව 270 ක් පමණක් බව තහවුරු කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදි ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සාමාජික ගොවීන් සංඛ්‍යාව 17,462 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණ විය. තවද, ඒ ඒ කොට්ඨාශවල තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරින් නොමැති වීම හේතුවෙන් අධිකාරිය යටතේ ලියාපදිංචි වූ සමිති 61ක කාර්යසාධනය ඇගයීම් කර නොතිබුණි. | සතුටුදායක මට්ටමේ සමිති ක්‍රියාකාරිත්වය පහළ යාමට හේතුව වී ඇත්තේ සමිති පොදු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි සමිතිය විසින් ඉටුකළ යුතු කාර්යයන්හි මන්දගාමී බවය . අධිකාරිය විසින් එම කටයුතු පිළිබඳ නිරන්තරව දැනුවත් කළද සමිති නිරතුරුවම රාජ්‍ය අනුග්‍රහකත්වය අපේක්ෂා කිරයි. 2018 වර්ෂයේදී සමිති ව්‍යවස්ථාව කාලානුරූපව සංශෝධනය කොට අධිකාරියේ අනුග්‍රහය හා මග පෙන්වීම ලබා දුන්නද සමිති ක්‍රියාත්මක වීම සතුටුදායක තත්ත්වයක පවත්වා ගැනීම එම සමිති නායකයින්ගේ අනිවාර්ය වගකීම බව සඳහන් කළහැක. | කුඩා තේ වතු සංවර්ධන සමිතිවල ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමෙන් පවත්වා ගැනීමට අධිකාරියේ අවධානය යොමු කළ යුතුය. |
| (ඇ)භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ තේ පැළ 2,460,000 ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අධිකාරිය මිල ගණන් කැඳවා තිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කර තිබුණු තවාන් හිමි ආයතන 3 ම ව්‍යාජ ආයතන බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තහවුරු කරගැනීම හේතුවෙන් එම මිල ගණන් ප්‍රතික්ෂේප කර පාළු පැළ සැපයීම නවතා දමා තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේ අධිකාරිය සතු තේ තවාන් 10 ක තේ පැළ 744,881 ක් නොවිකුණා ඉතිරිව පැවතුණද මෙම තවාන් සංවර්ධනය කර ඉහත භෝග පුනරුත්ථාපන වැඩසටහනේ පැළ අවශ්‍යතාවය සපුරා ගැනීමට අවධානය යොමුවී නොතිබුණි. | ඉහත වැඩසටහන යටතේ මිලදී ගැනීම සඳහා සුදුසු තත්ත්වයේ පැළ සපයා ගැනීම දුෂ්කර වූ බවත් ,මේ වන විට වගා කන්නය ආරම්භව තිබූ බවත් දන්වමි .<br>ආයතනික තවාන්වල නිපදවනු ලබන තේ පැළ සහනාධාර යටතේ තේ නැවත වගා කරනු ලබන ගොවීන් වෙත සැපයීම මුඛ්‍ය අරමුණ වන අතර ,එසේ නිපදවනු ලැබූ පැළ භෝග පුනුරුත්ථාපන වැඩසටහන සඳහා යොදාගනු ලැබුවේ නම් නැවත වගාකරනු ලබන ඉඩම් සඳහා පැළ හිඟ තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබුණි.<br>ප්‍රශස්ත වර්ධනයක් නොපෙන්වන පැළ ගොවීන් වෙත නිකුත් කරනු නොලැබේ .ඒ අනුව අදාළ වර්ෂය අවසානයේ ආයතනික තවාන් වල පැළ 744,881 ක් ඉතිරිව තිබුණ ද එම පැළ ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා යෝග්‍ය මට්ටමට වර්ධනය වී නොතිබූ බැවින් බෝග පුනුරුත්ථාපන වැඩසටහන සඳහා යොදා ගැනීමට හැකියාව නොතිබුණි. | ආයතනික තේ තවාන් සංවර්ධනය කර සහනාධාර වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රශස්ත වර්ධනයක් සහිත තේ පැළ සපයා ගැනීමට අවධානය යොමු කළ යුතුය. |
| (ඇ)තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ගුණාත්මක පැළ ලබාගැනීමට අධිකාරියේ ලියාපදිංචි වාණිජ තේ | වර්ෂය තුළ තවාන් 870ක් සඳහා අවසරපත්‍ර නිකුත්කර තිබුණද තවාන් 682 පමණක් තවාන් කටයුතු ආරම්භ කර තිබුණි. CN -5 | තේ පර්යේෂණ නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගෙන වාණිජ |

| | | |
|---|---|---|
| තවාන් **870** ක් පැවතියද,තේ පර්යේෂණ නිලධාරීන් විසින් පරික්ෂා කරන ලද තේ තවාන් ප්‍රමාණය 18/19 වර්ෂයේදී සියයට 25 ක් පමණක් විය.එමනිසා වාණිජ තේ තවාන් සඳහා පවතින අධීක්ෂණය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණ විය. | පරීක්ෂණ 457ක් නිමකර ඇති එය ප්‍රතිශතයක් ලෙස ගණනය කිරීමේදී 67% කි. | තේ තවාන්හි පරීක්ෂණ පුළුල් කළ යුතුය. |
| (ඉ) අධිකාරිය ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.**17,313,714** ක් වැය කර තිබූ අතර ඉන් රු.**7,104,573** ක් එනම් සියයට **41**ක් අධිකාරිය විසින් ප්‍රාදේශීය කාර්යාල බලප්‍රදේශයන්හි පවත්වන ලද ක්‍රීඩා උත්සවවල විද්‍යුත් හා මුද්‍රිත ප්‍රචාරණ කටයුතු සඳහා වැය කර තිබුණි. | වැඩි කුඩා තේ වතු හිමියන් පිරිසක් ඉලක්ක කරගැනීම සඳහා විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරණ කටයුතු සිදුකළ යුතු බැවින් සභාපතිවරයාගේ අනුමැතිය යටතේ අදාළ වැය දරා ඇති බව සඳහන් කරමි. | රජයේ මුදල් ආර්ථිකමය, කාර්යක්ෂමව හා ඵලදායීව අදාළ අරමුණු සඳහා යොදාගත යුතුය. |
| (ඊ) **2017** වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා තේ ශක්ති සුභසාධන අරමුදලෙහි සාමාජිකයන් සඳහා රක්ෂණාවරණ ඔප්පු ලබා ගැනීමට පෞද්ගලික රක්ෂණ සමාගමට අධිකාරිය රු.**27,358,214** ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද තේ ශක්ති සුභසාධන අරමුදලෙහි හිමිකරුවන් වෙත ගෙවීම සඳහා **2017** වර්ෂයේ සිට ලද රු.**690,525** ක් වාර්තාවේ දින දක්වා ප්‍රතිලාභීන්ට ගෙවීම් කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණකගේ **2019** නොවැම්බර් **15** දිනැති වාර්තාව අනුව තේ ශක්ති සුභසාධන ප්‍රතිලාභීන්ට රු.**8,502,397** ක් ගෙවිය යුතුව තිබූ බව වාර්තා කර තිබුණි..එසේ වුවත් **2020** සැප්තැම්බර් **15** දින වනවිටත් මෙම මුදල් අධිකාරියට ලැබී නොතිබුණි. | අදාළ ගෙවීම් ලියවිලි අධිකාරියේ මූල්‍ය අංශයට ඉදිරිපත් නොකිරීමට හේතුව හිමිකම් ඉල්ලුම් කරන ලද ප්‍රතිලාභීන් හා පසු හිමිකරුවන් පිළිබඳ තහවුරු කර ගැනීමේ ගැටලු වන අතර මෙම අඩුපාඩු සම්පූර්ණකර ගැනීම සඳහා අදාළ ප්‍රතිලාභීන් හා සමිති වලින් ලියවිලි කැඳවා ඇති අතර එම අඩුපාඩු සම්පූර්ණ කරගනිමින් ගෙවීම් කිරීමට කටයුතු කරමින් පවතී .අභ්‍යන්තර විගණකගේ වාර්තාව අනුව තේ ශක්ති සුභසාධන ප්‍රතිලාභීන් වෙත ගෙවිය යුතු රු.8,502,397 ක මුදල රක්ෂණ ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීම සඳහා රක්ෂණ සමාගම වෙතින් අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | සුභසාධන අරමුදලෙහි හිමිකරුවන් වෙත ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ ලබාදීමට හැකි ක්‍රමවේදයක් පවත්වාගෙන යාමට කටයුතු කළයුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රජය විසින් ක්‍රියාක්මක තේ පොහොර ව්‍යාපෘතිය යටතේ තේ ගොවීන්ට සහනාධාර ගෙවීම සඳහා **2016** වර්ෂයේ අධිකාරියට ලද මුදලින් රු.**32,065,870** ක් අපේක්ෂිත කාර්යය සඳහා නොයොදවා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රඳවා තබා ගෙන තිබුණි. | රජයේ පොහොර සහනාධාර මුදල් ගෙවීම් කර ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු ඉතිරි වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කුඩා තේ වතු හිමියන් හට කෘෂි උපකරණ ලබා දීම සඳහා යොදවා ඇත . මෙම ගිණුමේ සඳහන් ප්‍රමාණය ප්‍රදානයක් ලෙස ගැලපීම් කර ඉදිරි වර්ෂ 5ක් තුළ ක්‍රමක්ෂය ලෙස ලියාහැරීමට කටයුතු කරන බව දන්වමි. | ව්‍යාපෘතිය අවසන් වූ පසු ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළයුතුය. |
| (ආ) **2017** වර්ෂයේ ඇති වූ ගංවතුර ආපදාව හේතුවෙන් ගාල්ල, මාතර, රත්නපුර හා කළුතර ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්ට අදාළව කුඩා තේ ඉඩම් වලට සිදු වූ හානිය වෙනුවෙන් පූර්ණ හා අර්ධ | 2017 වර්ෂයේ ගංවතුර ආපදාවට ලක් වූ ඉඩම් වෙනුවෙන් ලබා දුන් සහනාධාර ගෙවීම් කර ඉතිරි වූ මුදල් අමාත්‍යාංශයට දැනුම් දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය | භාණ්ඩාගාරයෙන් ලද මුදල් අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමෙන් පසු ඉතිරි මුදල් නැවත |

| | | |
|---|---|---|
| හානි ලෙස සහනාධාර දීමනාවක් ගෙවීමට ලබා දී තිබූ මුදලින් ඉතිරිවූ රු.46,991,673 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | යටතේ නැවත වගා , අලුත් වගා ,පාලු සහනාධාර ගෙවීම් කරන ලදී. ඉතිරි ප්‍රමාණය ප්‍රදානයක් ලෙස සලකා ඉදිරි වර්ෂ 5ක් තුළ ක්‍රමක්ෂය ලෙසින් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීමට කටයුතු කරන බව දන්වමි. | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂය අවසානයට පොහොර හා ගංවතුර සහනාධාර ලෙස තේ ගොවීන් සඳහා සෘජු බැංකු හර කිරීම් රු.10,554,689 ක් සහනාධාරලාභි තේ ගොවීන් ඉදිරිපත්කර තිබූ ගිණුම් අක්‍රියවීම, නම හා ගිණුම් අංකය වෙනස්වීම ආදි කරුණු නිසා හිමිකම් නොපෑ චෙක්පත් ගිණුමට මාරුකර තිබූ අතර ඒවායේ කාලය මාස හය සිට අවුරුදු 5 දක්වා පරාසයක විය.මෙම මුදල් අදාළ සහනාධාර ලාභියාට ගෙවීමට හෝ භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි. | පොහොර සහ ගංවතුර සහනාධාර මුදල් ප්‍රතිලාභීන්ගේ ගිණුම්වල පවත්නා දෝෂ හේතුවෙන් හිමිකම් නොපෑ චෙක්පත් ගිණුමේ තාවකාලිකව ගිණුම්ගත කර ඇත . එනමුත් ප්‍රතිලාභීන් වෙත සහනාධාර හිමිකම් සඳහා නව බැංකු ගිණුම් විවෘත කර ඉදිරිපත් වන ලෙස වාර ගණනාවකදී ලියාපදිංචි තැපැල් මගින් දැනුම් දී ඇත . එයට අමතරව වර්තමානයේ ක්ෂේත්‍ර නිළධාරීන් මාර්ගයෙන් හිමිකම් ලැබූ සහනාධාර හිමියන් හට දැනුම් දීමට කටයුතු කර ඇත. | සහනාධාර මුදල් අදාළ කාලය තුළදී සහනාධාර හිමි ගොවීන් වෙත ලබාදීමට හා භාවිතා නොකරන ලද මුදල් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) කුඩා තේ වතු සංවර්ධන වැඩ කටයුතු වෙනුවෙන් දිවි නැගුම වැඩසටහන යටතේ නව තේ වගාව හා නැවත වගාව, ගම්මිරිස් වගාව, තේ ඉඩම්වල පාළු සිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා ලද රු.3,196,085 ක් 2016 වර්ෂයේ සිට අදාළ කාර්යය සඳහා නොයොදවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි. | දිවි නැගුම වැඩසටහන අවසන් වීම මත ඉතිරි මුදල් යොදවා දලු කතුරු හා දලු කුඩ වෙළඳපොල මිලෙන් අඩක් අයකර කුඩා තේ වතු හිමියන් හට අනුමැතීන් මත ලබා දෙන ලදී .දිවිනැගුම වැඩසටහනේ ඉතිරි ප්‍රමාණයද ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කර ඉදිරි වර්ෂ 05 ක් තුළ ක්‍රමක්ෂය කර ලියාහැරීමට කටයුතු කරන බව දන්වමි. | වැඩසටහන අවසන් වූ පසු ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව තේ ඉඩම්වල භාවිතය සඳහා වඩාත්ම යෝග්‍ය මුල්ලුව වන්නේ තලය හා මිට එකම ලෝහ අච්චුවක දමා එකට සාදාගත් මුල්ලුවක් වුවද ලංසු කැඳවීමේදී එම පිරිවිතරයෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ රු. 27,145,150 ක් වැය කර යකඩ මිට සහ තලය ලෝහ පෑස්සීමෙන් නිපදවනු ලැබූ මුල්ලු 9,450 ක් ප්‍රසම්පාදනය කර තිබුණි.ඒ අනුව තේ ගොවියාට තේ කර්මාන්තය සඳහා භාවිතා කළ හැකි වඩාත්ම යෝග්‍ය මුල්ලුව මිලදී ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. මෙම නිසා ඵලදායිතාවය සැලකිල්ලට ගෙන කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.එසේම මෙකී මිලට ගැනීම සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුවට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයෙකු පත්කරද නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදි කෘෂි උපකරණ බෙදා | ඇණවුම් කළ මුල්ලු ප්‍රමාණය අධිකාරිය වෙත සැපයීම සිදුව ඇත්තේ 2019 ජුනි 06 සිට 2019 ඔක්තෝබර් 07 කාලය තුළදීය . 2019 සැප්තැම්බර් 18 වන දින ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ආයතන වෙතින් සිදු කෙරෙන භාණ්ඩ බෙදා දීම් නවතා දමන ලදී .2020 වර්ෂයේ අවසරපත්‍රලාභී පුහුණු වැඩසටහන් අතරතුර බෙදා දීමට සැලසුම් කළද රටතුළ උද්ගත වූ කොරෝනා වසංගත තත්ත්වය හමුවේ පුහුණු වැඩසටහන් සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි විය.<br>නමුත් මේ වන විට ආරම්භ කර ඇති අවසරපත්‍ර පුහුණු වැඩසටහන් අතර බෙදා දීමට කටයුතු කෙරෙමින් පවතින බව දන්වමි. | ප්‍රසම්පාදන කාර්යයයේදී අධිකාරියේ අවශ්‍යතාවය මත පිරිවිතර සකසා වැයකරණ මුදලට වඩා වාසිදායක ලෙස භාණ්ඩ ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

හැරීමේ වැඩසටහන යටතේ ඉහත මිලට ගත් මුල්ලුද ඇතුළුව තේ ගොවියන් සඳහා බෙදා හැරීමට මුල්ලු **12,235** ක් පැවතියද සමාලෝචිත වර්ෂය තුළ මුල්ලු **596** ක් පමණක් බෙදා දී තිබුණි. එමනිසා වර්ෂ අවසානයට රු. **32,095,016** ක් වටිනා මුල්ලු අපේක්ෂිත අරමුණ සඳහා යොදා ගැනීමෙන් තොරව ප්‍රාදේශීය කාර්යාලයන්හි නිෂ්කාර්යව ගබඩා කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.5 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක **25/2014** හා **2014** නොවැම්බර් **12** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **07** වගන්තිය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී අනියම්, වෙක්රෝල් හා කොන්ත්‍රාත් පදනම මත අධිකාරිය විසින් සේවකයින් **52** දෙනෙකු බඳවාගෙන තිබුණි. ඉහත බඳවාගත් සේවකයින්ට සමාලෝචිත වර්ෂයේදී රු.**16,004,184** ක වැටුප් ගෙවා තිබුණි. | පත්වීම් බලධරයාගේ බලය අතික්‍රමණය කරමින් ලබා දී තිබූ මෙම පත්වීම් අවසන් කර උක්ත තත්ත්වය නිවැරදි කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | සේවකයින් බඳවාගැනීමේදී චක්‍රලේඛ ප්‍රතිපාදන අනුගමනය කළ යුතුය. |

### 3.6 අනාර්ථික වියදම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ මත තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී තනතුර සඳහා අටදෙනෙකු බඳවා ගෙන තිබූ අතර ඉන්පසුව තවත් **13** දෙනෙකු පොරොත්තු ලේඛනගත කර තිබුණි. අනතුරුව රු. **532,553**ක් පොරොත්තු ලේඛනගත නිලධාරීන් පුහුණුව සඳහා වියදම් කර තිබුණද **2019** ජුනි **24** දින එම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පුහුණු කරන ලද **13**දෙනා බඳවා ගැනීමට නීතිමය ප්‍රතිපාදනයන් නොමැති බැවින් නැවත පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. එමනිසා පොරොත්තු ලේඛනගත අයදුම්කරුවන් පුහුණු කිරීම සඳහා දරන ලද මුදල නීත්‍යානුකූල නොවූ හා අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය කෙරේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය මත බඳවා ගත් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරින් අටදෙනාට අමතරව පොරොත්තු ලේඛනයේ සිටි සුදුසුකම්ලාභින් දහතුන්දෙනෙකු අධිකාරියේ සභාපති විසින් ලබා දුන් නියෝග පරිදි හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ පැවති පුහුණු වැඩමුළුව සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. | බඳවාගැනීමට නීතිමය ප්‍රතිපාදනයන් නොමැති අයදුම්කරුවන් පුහුණු කිරීම සඳහා මුදල් වැයකිරීම නොකළ යුතුය. |